දරුවන් සම්බන්ධයෙන් වාර්තාවන් ඉදිරිපත් කිරීමේදී මාධ්‍ය ආචාර ධර්ම මගින් සඳහන් කරනුයේ, එම දරුවන්ට තම පාසල් අධ්‍යාපනය බාධාවකින් තොරව නිම කිරීමට අවකාශය තිබිය යුතු බවයි. ඒ අනුව,
බාලවයස්කාරයින්ගේ අනන්‍යතාවය හෙළිදරව් විය හැකි නම, ලිපිනය, ඡායාරූප පළ නොකළ යුතු බව මාධ්‍ය ආචාර ධර්ම තුළ නිර්දේශ කර ඇත.

මෙය කඩ වූ අවස්ථාවකට උදාහරණ ලෙසින්, සිළුමිණ පුවත්පතේ (පෙබරවාරි 20, 2022), "චැට් කළ පෙම්වතා සොයා කිලෝමීටර් 500ක් ගිය ගම්පොළ දැරිය" යන සිරස්තලය යටතේ පළ වී තිබූ ලිපිය පෙන්වා දිය හැක. එහි දැක්වෙන ආකාරයට පුවතට අදාළ දැරියගේ වයස අවුරුදු 13 ක් වන අතර, එහි එම දැරියගේ සම්පූර්ණ නම, ලිපිනය ආදී පෞද්ගලික තොරතුරු සඳහන් වී තිබුණි.

- බාලවයස් දැරියකගේ අනන්‍යතාවය හෙළි කිරීම හරහා, ඇගේ පාසල් අධ්‍යාපනයට මෙන්ම සමාජ ජීවිතයටද සෘණාත්මක බලපෑමක් ඇති නොවේ යැයි ඔබ සිතනවා ද?

- ඇයගේ අනන්‍යතාවය පළ නොකරමින් මෙම පුවත වාර්තා කිරීමෙන්, පුවතේ හරයට කිසිදු වෙනසක් වෙතැයි ඔබ සිතන්නේ ද?

- එසේ නම්, මෙවැනි වාර්තාකරණයක්, මාධ්‍ය ආචාර ධර්ම උල්ලංඝනයන් ලෙසින් ඔබ නොසලකන්නේ ද?

මූලාශ්‍ර:
http://www.mediareform.lk/.../120-Code-of-Professional...
https://accountablejournalism.org/.../empowering-children...